ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2019
------------------------------------------

## 1.1 මතය වියාචනය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡාකර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය  කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,  සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ  අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ  වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු අගය රු.මිලියන **436.44** ක් වූ ජර්නල් සටහන් **1,478** ක් මගින් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් අතර ගැලපීම් සිදු කර තිබුණද ඉන් රු.මිලියන **306.31** ක් වූ ජර්නල් සටහන් **1,370** ක් හා ඊට අදාළ ජර්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම නිසා එම ගිණුම් අතර සිදුකර තිබුණු ගැලපීම් සතුටුදායක ලෙස විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | **2020** වර්ෂයේ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාළ උපකාරක වාර්තාවන් නිසියාකාරව ඉදිරිපත් කිරීමට එකඟ වන බව. | ගිණුම් කටයුතුභාවය තහවුරු කිරීමට හැකි වන පරිදි අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතින් ස්ථාපිත කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය හෝ භරිත සාමාන්‍ය පිරිවැය පදනම් කර ගෙන තොගවල පිරිවැය ගණනය කර නොතිබීම, තොගවල ඌනතා හා අතිරික්තතා සැලකිල්ලට ගැනීමකින් තොරව සහ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට අවසන් තොගයෙහි වටිනාකම ගණනය කර නොතිබීම යන කරුණු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය රු.මිලියන **98.68** ක් ලෙස දක්වා තිබුණු තොගවල වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත **2** හි සඳහන් නියමයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම ඉහත තොග වටිනාකමෙහි ඇතුළත් රු.මිලියන **4.50** ක හානි වූ තොගයක් සඳහා රු.මිලියන **3** ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණද එම ප්‍රතිපාදනය ඇති කිරීමේ | **FIFO** ක්‍රමය යටතේ තොග පවත්වාගෙන යාමට අලෙවි මධ්‍යස්ථාන තුළ පරිගණක මෘදුකාංග පහසුකම් නොමැති බව, **2020** ගිණුම් ප්‍රකාශන තුළ අදාළ හෙළිදරව් කිරීම් සිදු කරන බව, සංස්ථාව ශුද්ධ උපලබ්ධි අගයට විකුණුම් සිදුනොකරන බව හා සියලුම ඖෂධ සඳහන් කර ඇති මිලට විකුණන බව, පෞද්ගලික අංශය වෙත වට්ටම් ලබා දෙන නමුත් එය පිරිවැයට වඩා අඩු අගයක් නොවන බව හා ඉහත හේතුන් මත දෙසැම්බර් **31** දිනට සියලුම ඖෂධ පිරිවැයට අගය කර ඇති බව. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර මෙම වැරදි නිවැරදි කර **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පදනම සහ එහි විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද ඉහත තොග වටිනාකමට ඇතුළත් නොවූ **2019** දෙසැම්බර් **31** දිනට පැවති පිරිවැය රු.මිලියන **5.55** ක් වූ භාවිතයට ගත නොහැකි ඖෂධ තොගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ප්‍රමිත **8** හි **42** ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රතිෂ්ඨානය කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම් රු.මිලියන **22.07** ක් ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභ ශේෂයට ගලපා තිබුණි. | **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කරන බව. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර මෙම වැරදි නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිත **16** හි **79** (ආ) ඡේදය ප්‍රකාරව, පිරිවැය රු.මිලියන **3.25** ක් හා සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති භාවිතා කරනු ලබන වාහන **05** ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙම වාහන **05** හි පොත් අගය සටහන් කර ඇති බව, මෙම වාහන **05** පමණක් ප්‍රත්‍යාගණනය කළ හොත් අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව හා ඉදිරි වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකොට අදාළ ගැලපීම් කරන බව. | -එම- |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2019** දෙසැම්බර් **31** දිනට අලෙවි මධ්‍යස්ථාන **04** කින් සිදුකර තිබුණු ණයට විකුණුම් රු.මිලියන **3.31** ක් ගිණුම් ගත කර නොතිබුණි. මෙම නිසා වර්ෂයේ දළ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විකුණුම් ඉන්වොයිස් පදනම් කරමින් ගිණුම් අංශයේ ගිණුම් යාවත්කාලින කර ඇති බව. | මෙම වරද නිවැරදි කර **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් බදු වගකීම රු.**820,104** කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙය **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ සේවක භාරකාර අරමුදල් වියදම, සේවක අර්ථසාධක අරමුදල් වියදම, පොලී ආදායම් හා ඇසුරුම් ද්‍රව්‍ය වියදම් ගිණුම්ගත නොකිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 2.18 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී අත්පත් කරගෙන තිබුණු යන්ත්‍ර දෙකක පිරිවැය වූ රු.මිලියන 13.44 ක් අදාළ වත්කම් යටතේ ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කරන බව. | මෙම වරද නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවා නියුක්ති භාරකාර අරමුදලේ දායකය හා අධිභාරය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු රු.මිලියන 1.87 ක මුදලින් රු.මිලියන 1.49 ක් පමණක් අදාළ වියදම් ගිණුමට හර කර ඉතිරිය වූ රු.376,360 ක මුදල උපචිත වියදම් ගිණුමට හර කර තිබුණි. මෙම නිසා උපචිත වියදම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනාගාරයේ වහලය අළුත්වැඩියාව සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් වැයකර තිබුණු රු.මිලියන 1.59 කට අදාළ රු.54,892 ක ක්‍රමක්ෂය ගිණුම් ගත කර නොතිබුණි. තවද ඉදිකිරීම් හා නවීකරණයන් සඳහා හා තේ ඇසුරුම් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් වැයකර තිබුණු මුළු මුදල රු.මිලියන 30.41 කට අදාළ 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ක්‍රමක්ෂය රු.මිලියන 5.06 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **2018** වර්ෂයේදී සංස්ථා පරිශ්‍රයට ගල් ඇතිරීමට හා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.මිලියන **6.62** න් රු.මිලියන **2.79** ක් අඩුවෙන් ප්‍රාග්ධනගත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීම සඳහා රු.මිලියන **1.35** ක් පොදු අත්තිකාරම් ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | **2018** සැප්තැම්බර් **13** දින වන විට වැඩ අවසන් කර තිබුණු ඉදිකිරීමක් සඳහා වැයකර තිබුණු රු.මිලියන **2.79** ක් ප්‍රාග්ධනගත නොකර කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබීමේ වරද හා තවත් ඉදිකිරීමක් සඳහා වැයකර තිබුණු රු.මිලියන **1.41** ක් ප්‍රාග්ධනගත නොකර අයභාර වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කර **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

**1.5.4** නොසැසඳු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු විෂයයන් **05** කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛන හා ශේෂ සනාථන සහතික අනුව වූ වටිනාකම අතර රු.මිලියන **23.15** ක වෙනසක් පැවතිය නමුත් වෙනසට හේතු පැහැදිළි නොකෙරුණි. | ණයට විකුණුම් හා පොලී ආදායම් ගිණුම් ගත නොකිරීම හා ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව දෝෂ සහිතවීම හේතුවෙන් වෙනස්කම් පවතින බව. | අනුරූපී වාර්තා සමඟ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.5** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2019** දෙසැම්බර් **31** දිනට පැවති රු.මිලියන **146.71** ක් වූ ණයගැති ශේෂ **17** ක් හා රු.මිලියන **41.32** ක් වූ ණයහිමි ශේෂ **62** ක් සඳහා ශේෂ සනාථ සහතිකද, අයිතම **04** ක් යටතේ ලාභයට එරෙහිව ලියාහැර තිබුණු රු.මිලියන **15.96** ක් වූ | ණයගැතියන් **52** දෙනෙකු හා ණයහිමියන් **38** දෙනෙකු වෙත ශේෂ සනාථන ලිපි යොමු කළ නමුත් ණයගැතියන් **10** දෙනෙකු හා ණයහිමියන් **03** දෙනෙකු පමණක් ශේෂ සනාථන එවා ඇති බව, කිසිදු ගිණුමක ශේෂයක් කපා | ණයගැති හා ණයහිමි පාලන ගිණුම් පවත්වා ගත හැකි වන පරිදි ගිණුම්කරණ පද්ධතිය හඳුන්වාදිය යුතු අතර ශේෂ සනාථන ලබා ගැනීමට හා ශේෂ සනාථන නොඑවන ණයගැතියන් හා ණයහිමියන් |

| | | |
|---|---|---|
| ලියාහැරීම්වලට අදාළ මූලාශ්‍ර ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය. | හැර නොමැති හා පෙර වර්ෂවල වැරදි නිවැරදි කිරීම් සිදුකර ඇති බව. | සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර අනන්‍යතාවය තහවුරු කර ගත යුතුය. වැරදි නිවැරදි කිරීම්වලට අදාළ මූලාශ්‍ර ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 203.55 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු.මිලියන 2.49 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය අංශයේ ආයතන 13 කින් අයවීම් හිඟ හිටි ණය ශේෂ වූ අතර ඉන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. එම රාජ්‍ය අංශයේ ආයතන 13 න අතරින් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ලෙස රු.මිලියන 1.25 ක් දක්වා තිබුණ නමුත් සංස්ථාවට පියවීමට කිසිදු ශේෂයක් නොමැති බව එම දෙපාර්තමේන්තුව විසින් සනාථ කර තිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතු ණය මුදලක් නොමැති බව එම දෙපාර්තමේන්තුවෙන් දන්වා සිටිය නමුත් එය නිවැරදි පිළිතුරක් නොවන බැවින් මුදල් ගෙවන ලෙස 2019 දෙසැම්බර් 05 දින යළි ලිපියක් නිකුත් කළ බව. | ණය අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. ඒ සඳහා සුදුසු හා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 48.41 ක් වූ මුළු ණයහිමි ශේෂය තුළ පැවති ණයහිමි ශේෂ 41 කට අදාළ රු.මිලියන 38.06 ක් වූ ණය පියවීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාද කාලය දින 431 ඉක්මවා තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව මිලදීගෙන ඇති බැවින්ද, භාණ්ඩවල ගුණත්වය පිළිබඳ ගැටළු පැවතුණු බැවින්ද, අදාළ තත්ත්ව වාර්තා ලබාදී නොතිබුණු බැවින්ද, සමහර ගෙවීම් අත්හිටුවා ඇති බව. | ගිණුම්ගත කළ හැකි ණයහිමියන් පමණක් ගිණුම්ගත වන පරිදි හා සංස්ථාවට අත්‍යාවශ්‍ය සැපයුම් ගුණාත්මකව ලබාගත හැකි පරිදි, ණයහිමියන් සම්බන්ධව විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වාදී නියමිත කාල සීමාවන් තුළ ණයහිමියන්ට ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 102, 103, 104,105 හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 108 | 2007 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ ඒ ඒ වර්ෂවලදී හඳුනාගෙන තිබුණු රු.මිලියන 19.88 ක් වූ තොග අතිරික්තතා පොත්වලට ගැනීමට හා ඒ ඒ වර්ෂවලදී හඳුනාගෙන තිබුණු රු.මිලියන 18.61 ක් වූ තොග ඌනතා හා 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4.50 ක් වූ හානි වූ තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අංශය මගින් තොග ඌනතා හා අතිරික්තතා වාර්තා පිළියෙළ කොට මානව සම්පත් අංශය වෙත ඉදිරිපත් කරන බව, මානව සම්පත් අංශය විසින් කමිටුවක් පත් කොට තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධව වෙනම වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන බව හා එම වාර්තාව පදනම් කර ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දෙනු ලබන නිර්දේශ මත අදාළ ගැලපීම් සිදුකළ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානිවීම්වලට හා ඌනතාවලට පාදක වූ හේතූන් හා වගකිවයුත්තන් හඳුනාගැනීමට කටයුතු කළ යුතු අතර පාඩුව අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ අදාළ පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළග මාසයේ 15 වැනි දිනට පෙර පිළියෙල කළ යුතු වුවද, එක් ජංගම ගිණුමකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ 2019 අප්‍රේල් මාසය දක්වා පමණක් පිළියෙල කර තිබුණි. | නාවින්න අලෙවි මධ්‍යස්ථානයට කාඩ්පත් මගින් ගෙවීම් සිදු කිරීමට පහසුකම් ලබාදී ඇති අතර ඊට අදාළ රිසිට්පත් ප්‍රමාදවී ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීම හේතුවෙන් බැංකු සැසඳුම් පිළියෙල කිරීම ප්‍රමාද වූ බව. | බැංකු සැසඳුම නියමිත දිනයට පිළියෙල කළ හැකි වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රමවත් කළ යුතුය. |
| (ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | යාවත්කාලීන කරන ලද ආයතන සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය, දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), එය ක්‍රියාත්මක කාල රාමුව | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ලෙස ප්‍රාග්ධන සැලැස්ම පිළියෙල කළ බව හා ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) ඉදිරි වර්ෂයේ සිට පිළියෙල කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලරාමුව තුළ විධිමත් ලෙස පිළියෙල කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම / ප්‍රතිඵල යනාදී විස්තර ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ඇ) | **1994** ජුනි **14** දිනැති අංක **95** දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ පහකදී මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු මුළු දිරි දීමනාවල එකතුව රු.මිලියන **432.12** ක් විය. | නිෂ්පාදන ආයතනයක දෛනික, මාසික සහ වාර්ෂික ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා සේවකයන්ගේ පැමිණීම ඉහළ මට්ටමක පැවතිය යුතු බව, ඵලදායීතාව ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගැනීමට කාලීනව උචිත ක්‍රමෝපායන් ක්‍රියාත්මක කළ යුතු බව, මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා තෙක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත දැනට සිදු කරන දිරි දීමනා ගෙවීම් ක්‍රමවේදය නතර කළහොත් එය අරමුණු සහ ඉලක්ක ලඟා කර ගැනීමට බාධාවක් වන බව, එමඟින් මෙහෙයුම් අලාභයක් ලැබීමට ඇති ඉඩකඩ නොසලකා හැරිය නොහැකි බව හා දිරි දීමනා ගෙවීමේ ක්රමවේදය හා ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කිරීම අනුමත කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සියළුම අංශවල නිලධාරීන්ගේ කාර්යසාධන මට්ටම ඉහළ නංවන ආකාරයට දිරි දීමනා ක්‍රමය පිළියෙල කර විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් දිරි දීමනා ගෙවිය යුතුය. විධිමත් අනුමැතියකින් තොරව හා නීත්‍යානුකූල නොවන ලෙස දිරි දීමනා ගෙවීම සඳහා අධිකාරී බලය හා අනුමැතිය ලබා දෙන සහ සහතික කිරීම සිදුකරනු ලබන නිලධාරීන් අධිභාරයට යටත් වන බව සැලකිය යුතුය. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.2.1** හා **4.2.2** මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ **3** ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ පසුගිය විගණන කමිටු රැස්වීම්වලදී දෙන ලද උපදෙස් අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සෑදීම සඳහා මේ වන විටත් සැලසුම් අංශය, සැපයුම් අංශය සහ කෘෂි නිලධාරීන් එක්ව කටයුතු කරමින් පවතින බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව භාවිතා කරන පරිගණක පද්ධතියට සංස්ථාවේ විවිධ අංශ විසින් ඇතුළත් කරන දත්තවල නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා ඒ ඒ අංශ විසින් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිත කර නොතිබුණි. 2011 වර්ෂයේ සිට ණයහිමියන්ට හා උපචිත වියදම් සඳහා මුදල් ගෙවීමේදී සහ නොමිලේ ලැබෙන අමු හා වියලි ඖෂධ වර්ග ගබඩා තොගයට ඇතුළත් කිරීමේදී සිදුව තිබුණු වැරදි නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පමණක් වටිනාකම රු.මිලියන 15.96 ක් වූ ගැලපීම් කිරීමට සිදුවී තිබුණි. | සංස්ථාව විසින් දැනට භාවිතා කරනු ලබන පරිගණක පද්ධතියේ අභ්‍යන්තර පාලන ක්‍රමයන් නිසි පරිදි ක්‍රියාත්මක වන බව, ඇතුළත් කරන දත්ත තනි පුද්ගලයකුගේ අභිමතය පරිදි වෙනස් කළ නොහැකි බව, පරිගණක පද්ධතිය සඳහා ස්ථාපිත කළ යුතු යම් පාලන ක්‍රම අවශ්‍ය නම් ඒවා හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව හා සෑම අංශයක්ම සම්බන්ධ විය හැකි පරිදි නව පරිගණක පද්ධතියක් (ERP) පිහිටුවීම සඳහා වන මූලික වැඩකටයුතු කෙරෙමින් පවතින බව. | දැනට පවතින පරිගණක පද්ධතිය තුළට සංස්ථාවේ සියළුම අංශවලින් ඇතුළත් කරන දත්තවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද පරිගණක පද්ධතියෙන් බාහිරව ස්ථාපිත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.648,204 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 23.07 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 22.43 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.මිලියන 29.75 කින් වැඩිවූවද, විකුණුම් පිරිවැය රු.මිලියන 61.19 කින් හා පරිපාලන වියදම් රු.මිලියන 6.06 කින් වැඩිවීමද වෙනත් ආදායම් රු.මිලියන 3.10 කින් අඩුවීමද මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලෙවි ආදායම සියයට 4 කින් පමණක් වැඩිවී තිබුණු අතර විකුණුම් පිරිවැය සියයට 14 කින් වැඩිවී තිබුණි. කෙසේ වෙතත් මූල්‍ය ආදායම් සියයට 422 කින් වැඩිවී තිබුණු අතර වෙනත් ආදායම් සියයට 44 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 6 කින් හා සියයට 3 කින් අඩුවී තිබුණි. නමුත් ජංගම අනුපාතය 0.44 කින් හා ක්ෂණික වත්කම් අනුපාතය 0.48 කින් වැඩිවී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.මිලියන 7.32 ක් වැයකර යුනානි ඖෂධ මිලදී ගැනීම, රු.මිලියන 1.51 ක් වැයකර වියලි මිදි කිලෝග්‍රෑම් 2,230 ක් මිලදී ගැනීම, රු.168,000 ක් වැයකර මී ඉටි කිලෝග්‍රෑම් 200 ක් මිලදී ගැනීම, රු.මිලියන 1.99 ක් වැයකර අශුද්ධ ගුගුල් කිලෝග්‍රෑම් 1,500 ක් මිලදී ගැනීම යන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු මූලික විමර්ශන වාර්තා 2016 හා 2017 වර්ෂයන් තුළදී සංස්ථාව වෙත ලැබී තිබුණද, ඒ පිළිබඳව අමාත්‍යාංශ විමර්ශන කමිටුව විසින් ලබාදී තිබුණු තීරණ 2020 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මිලදී ගැනීම් සම්බන්ධයෙන් සිදුවී තිබුණු අක්‍රමිකතා පිළිබඳව හිටපු සැළසුම් කළමනාකරුට එරෙහිව විනය පරීක්ෂණයක් කිරීමට සූදානම් වූ බව, ඔහුගේ ඉල්ලා අස්වීම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර නීති මඟින් සිදු වූ අලාභයන් අයකර ගැනීමට කටයුතු කර තිබුණු බව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව නීති මඟින් කටයුතු කිරීමට නොහැකි බැවින් රේඛීය අමාත්‍යාංශයේ නීති නිලධාරී හරහා මෙම අලාභය අය කර ගැනීමට සිවිල් නඩුවක් පැවරීමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශ විමර්ශන කමිටුව විසින් ලබාදී තිබුණු තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 164.65 ක් වූ රාජ්‍ය අංශ ණය අයකර ගැනීම මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවතුණි. | 2019 වර්ෂයට අදාළ රාජ්‍ය අංශයෙන් ලැබිය යුතු මුදල් සියල්ල අයකර ඇති බව. | ඉකුත් වර්ෂවලට අදාළ රාජ්‍ය අංශ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජංගම අලෙවියට අදාළ ණය කොන්දේසිවලට පටහැනිව ණයට විකුණුම් සිදුකර තිබුණු බැවින් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගත නොහැකිව තිබුණු මුළු ණය ශේෂය රු.මිලියන 11.45 ක් විය. | ණයට සිදු කරනු ලබන අලෙවිය අධෛර්යට පත් කිරීම සහ ණය කොන්දේසි වලට පටහැනිව සිදු කරනු ලබන අලෙවිය වලකාලීම සඳහා 2020 වර්ෂය තුළදී ණය කොන්දේසි යාවත්කාලීන කළ බව. | සියළු ණය අයකර ගැනීමට හා ජංගම අලෙවියට අදාළ ණය කොන්දේසි සුදුසු පරිදි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **1969** මැයි **11** දිනැති අංක **14,853/3** දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් සංස්ථාවේ අරමුණු **07** අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීම සඳහා කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම හෝ ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගැනීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගව පට්ටි පාලනය සඳහා සුදුසු දේශගුණික තත්වයන් යටතේ ප්‍රමාණවත් ඉඩකඩ සහිත ඉඩම් හා සුදුසු ආහාර සුලභව නොපැවතීම, නිලධාරීන් හා සේවකයින්ගේ හිඟය, ශීතාගාර පහසුකම්, සුදුසු පරිසරය හා අවශ්‍ය පහසුකම් නොතිබීම වැනි ප්‍රායෝගික කරුණු හේතුවෙන් එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වූ බව, මී මැසි පාලනය සඳහා දැනට ශක්‍යතා අධ්‍යනය හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කරන බව, මී මැසි පෙට්ටි සහ අනෙකුත් අවශ්‍ය උපදෙස් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා **2017** වර්ෂයේදී බඳවා ගත් කෘෂිකර්ම නිලධාරිවරයාගේ අධීක්ෂණය යටතේ එම කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටු කිරීමට හෝ විධිමත් පරිදි අරමුණු සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්මට හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන බව ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව නිෂ්පාදන හා අලෙවි අංශයන්හි කාර්ය සාධන ඉලක්ක වර්ෂ ගණනාවක සිට සංශෝධන සහිතව හඳුන්වාදී ඇති බව, අනෙකුත් අංශ සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වාදීමට කටයුතු කරමින් පවතින බව හා ඒ සඳහා එළදායීතා ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධවී කටයුතු කරන බව. | සංස්ථාවේ එක් එක් අංශයේ ක්‍රියාවලියන්හි කාර්යසාධනය ඇගයීම සඳහා දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) | නිෂ්පාදන පිරිවැය පාලනය හා තොරතුරු ලබා ගැනීම සඳහා කළමනාකරණ ගිණුම් පද්ධතියක් හඳුන්වාදීමට හා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම නිසා නිෂ්පාදන කටයුතු හා පිරිවැය පාලනය ක්‍රමවත් ආකාරයට සිදු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. එසේම නිෂ්පාදන ක්‍රියාවලිය හා ගබඩා පාලනය සම්බන්ධව විධිමත් පිළිවෙත් හඳුන්වා දී නොතිබීම නිසා තොග ඌනතාවයන් ඇති වී | සැලසුම් අංශය විසින් නිෂ්පාදන සැලසුම්, සත්‍ය නිෂ්පාදන වාර්තා, කාර්යසාධන හා ප්‍රගති වාර්තා හා ලේඛන සකස් කිරීමේදී පරිගණක දත්ත පද්ධතියේ ඇති තොරතුරු භාවිතා කරන බව, එම තොරතුරු අදාළ කරගෙන අංශවල කටයුතු පවත්වාගෙන යන බැවින් හා නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියළු | නිෂ්පාදන සැලැස්මේ ප්‍රගතිය, නිෂ්පාදන අංශයේ තිබිය යුතු නිෂ්පාදන වැඩපත් අනුව පිළියෙල කළ යුතුය. මීට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය විධිමත්ව ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබීම හා තොග ගබඩාවල තොග මට්ටම්වල සැලකිය යුතු විචලනයක් ඇති වී තිබීම යන කරුණු විගණනයේදී නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාවකට අනුව හඳුනාගත් තොග ඌනතාවයන්වල වෙළඳපළ අගය රු.මිලියන **2.60** ක් විය. | කටයුතු පරිගණක දත්ත පද්ධතිය හරහා සිදු කරන බැවින් එම තොරතුරු නිවැරදි තොරතුරු ලෙස සලකන බව, එබැවින් ඖෂධ ගබඩා වලට අදාළ තොරතුරු නිවැරදිව පරිගණක ගත කිරීම ගබඩා භාරකරුවන්ගේ සහ ගබඩාභාර නිලධාරීන්ගේ වගකීම සහ වගවීමක් වන බව, මේ වන විට නිෂ්පාදන ඇසුරුම් හා බෝතල් පිරවුම් අංශයෙන් ගබඩාවන් සඳහා නිකුත් කරනු ලබන නිෂ්පාදන ප්‍රමාණයන් නිවැරදිව වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ නිකුත් කිරීමටත් පරිගණක දත්ත පද්ධතියෙන් නිකුත් කරන නිෂ්පාදන ලැබීම්පත් එම අවස්ථාවේදීම නිකුත් කිරීමටත් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව හා ඉදිරියේදී බෝතල් අංශයට පරිගණකගත පැකේජයක් හඳුන්වා දීමට නියමිත බව. | මෙම ඌනතාවය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර සංස්ථාවට සිදුවී ඇති පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී නව නිෂ්පාදන නොවන ඖෂධ කාණ්ඩ වර්ග **13** ක් හා නව නිෂ්පාදන වර්ග **38** ක් යටතේ නිෂ්පාදන ඒකක **1,888,376** ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද තත්‍ය නිෂ්පාදනය ඒකක **1,422,366** ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය ඒකක **466,504** කින් ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම පෞද්ගලික අංශයේ අපේක්ෂිත ආදායමෙන් ළඟා කර ගත නොහැකි වී තිබුණු ආදායම රු.මිලියන **71.14** ක් හෙවත් සියයට **33** ක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය අංශය වෙත නිෂ්පාදන වර්ග **108** කට අදාළ ඉල්ලුම සපුරාලිය නොහැකිවීම හේතුවෙන් සංස්ථාවට අහිමි වී තිබුණු ආදායම රු.මිලියන **58.80** ක් විය. අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරවම රාජ්‍ය අංශයෙන් ලැබෙන මෙම ඉල්ලුම සපුරාලිය නොහැකිවීම තුළින් නිශ්චිත වෙළඳපොල කොටස අත්හැරීයාමේ අවදානමක් පැවතුණි. තවද ආයතනය විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරඟකාරී ආයතන අතර ආයතනයේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් ආයතනය සතුව නොතිබුණි. | අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී සිදු වන අපහසුතා, අවස්ථානුකූලව යන්ත්‍ර සූත්‍ර වල සිදු කරන අළුත්වැඩියා කටයුතු, වර්ෂය තුළ සිදු වූ මාසික අලෙවි ඉල්ලුම් රටාවේ වෙනස්කම් වැනි කරුණු හේතුවෙන් සැලසුම්ගත නිෂ්පාදනය සියයට **100** දක්වා ළඟාකර ගැනීමට නොහැකිවූ බව, අහිමි වූ ආදායම යළි ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන හා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට, අදාළ අංශ අතර නිසි සම්බන්ධීකරණයක් ගොඩනගමින් අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම කල් තියා පිළියෙල කර ගැටළු හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදීම තුළින් වෙළඳපොල ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට හා මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කිරීමට ඉහළ කළමණාකරණය කටයුතු කර ඇති බව හා වෙළඳපොළ කොටස හඳුනාගැනීමට සමීක්ෂණයක් ඉදිරියේදී සිදුකරන බව. | ප්‍රායෝගිකව ළඟාකර ගත හැකි ඉලක්කයන් ලබාදීමට, අමුද්‍රව්‍ය හිඟයට ස්ථිරසාර විසඳුම් සෙවීමට හා නිෂ්පාදන අංශයේ මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කර ගැනීමට කටයුතු කරමින් ඉලක්කයන් කරා ළඟාවිය යුතුය. එසේම තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමටත්, අපේක්ෂිත අලෙවි ආදායම ළඟාකර ගැනීමටත් කටයුතු කළ යුතුය. අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරවම සපුරාලිය හැකි රාජ්‍ය අංශයේ නිශ්චිත වෙළඳපොල කොටස ආරක්ෂාකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්‍ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු විරෝධතා නොසළකා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් පදනම් කර ගෙන සංස්ථාවේ **50** වන සංවත්සරය නිමිත්තෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන **2.55** ක් සේවක මණ්ඩල ත්‍යාග වවුචර් වෙනුවෙන් සමූපකාර තොග වෙළඳ සංස්ථාව වෙත ගෙවා තිබුණි. | මෙම යෝජනාවට භාණ්ඩාගාර නියෝජිත හා අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් එකඟ නොවන බව ප්‍රකාශ කළද සේවකයින් සඳහා තිළිණයක් ලබාදීම සම්බන්ධව තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බව ඔවුන් විසින් වැඩිදුරටත් සඳහන් කර ඇති බව, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව හා සෑම වසරකම සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සියළුම සේවකයින් හට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ත්‍යාග වවුචරයක් ලබා දෙන බව. | ආයතනයේ මූල්‍ය තත්ත්වය හා මෙහෙයුම් කටයුතුවල ඵලදායීතාවය සලකා බලා නියමිත අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් මෙවැනි ගෙවීම් කිරීමට වගබලා ගත යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 5 ½ කින් යුක්ත මැදවච්චිය ඔසු උයන විශාල වශයෙන් වල් බිහිවී තිබුණු අතර නඩත්තු කටයුතු සඳහා එක් සේවකයෙකු පමණක් යොදවා තිබුණි. වගා බිම තුළ විවේකාගාරයක් හා උපකරණ තබාගැනීමට ස්ථිර ගොඩනැගිලි පහසුකම් හෝ ජලය ලබාගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් යොදා නොතිබුණි. නිසි නඩත්තුවක් හා නිලධාරීන්ගේ අවධානය යොමු නොවීම හේතුවෙන් ඔසු උයන ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි. | මේ වන විට ඔසු උයන සඳහා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව, ඔසු උයනෙහි සාදා ඇති නල ළිඳ සඳහා ජල පොම්පයක් මිලදී ගැනීමට කටයුතු කර ඇති බව, ඔසු උයන සඳහා අවශ්‍ය ලීටර් **5000** ජල ටැංකි **02**ක් මිලදී ගෙන ස්ථානගත කර ඇති බව හා මේ වන විට කම්කරුවන් දෙදෙනා විසින් අදාළ භූමියෙහි වල් මර්ධන කටයුතු, නඩත්තු කටයුතු හා නව වගා සංස්ථාපනයද සිදු කර ඇති බව. | ඔසු උයන ඵලදායී ලෙස හා කඩිනමින් උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | විජේරාම අලෙවි මධ්‍යස්ථානය සඳහා මහල් 3 කින් සමන්විත වර්ග අඩි 3,500 ක ගොඩනැගිල්ලක් 1996 වර්ෂයේ සිට සංස්ථාව විසින් කුලී පදනමට ලබාගෙන තිබුණද ගොඩනැගිල්ලෙහි බිම් මහල පමණක් භාවිතයට ගෙන තිබුණි. පළමුවන හා දෙවන මහල ඵලදායී ලෙස ප්‍රයෝජනයට නොගෙන අබලි ද්‍රව්‍ය ගොඩ ගසා අපිරිසිදු තත්ත්වයෙන් පැවතුණි. ඒ අනුව 1996 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් | මේ වන විට අබිලි ද්‍රව්‍ය ඉවත් කර ඇති බව, අලෙවි මධ්‍යස්ථානය අළුත්වැඩියා කර දෙන ලෙසට ගොඩනැගිලි අයිතිකරුගෙන් ඉල්ලුම් කර ඇති බව, භාවිතයකින් තොරව පවතින ඉහළ මහල සඳහා යම් ඇගයීමක් සිදු කර ඵලදායීව භාවිතා කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව, 2019 වර්ෂයේදී අලෙවි ආදායම විවිධාංගිකරණ සංකල්පය යටතේ කොළ කැඳ ලබා දීම මාස 03 ක් සිදු කළත් ඉන් | ගොඩනැගිල්ල ඵලදායීව උපයෝජනය කළ හැකි වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් වැයකර තිබුණු මුළු බදු කුලිය රු.18,795,000 න් රු.12,530,000 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවීම මත එය තාවකාලිකව නවතා ඇති බව. | |
| (ඈ) | ගාල්ල හා මාතර අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යන ගොඩනැගිලි කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර ගොඩනැගිලි දෙකෙහිම උඩු මහල් නිශ්ක්‍රියව පැවතුණි. | ගාල්ල අලෙවි මධ්‍යස්ථානයෙහි ඉහළ මහලෙහි වෛද්‍ය සායන කටයුතු ආරම්භ කිරීම සඳහා මේ වනවිට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව. | ගොඩනැගිල්ල ඵලදායීව උපයෝජනය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.6** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පතිරගොඩ නව නිෂ්පාදනාගාරයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 36.86 කට සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 11.62 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. කළ වැඩ පිළිබඳ විස්තරාත්මක බිල්පතක් පිළියෙල කර නොතිබුණු අතර කළ වැඩ පිළිබඳ නිර්දේශයකින් තොරව ගෙවීම් කර තිබුණි. 2020 සැප්තැම්බර් 04 දින වන විට ඉදිකිරීම් නවතා වැඩබිම අක්‍රියවී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත් සමාගමේ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳව ඇගයීමක් සිදුකර නොතිබුණි. තවද ඉදිරිපත් කර තිබුණු අතාත්ත්වික අඩු අනුප්‍රමාණයන් (Unrealistic Rates) පිළිබඳව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 මාර්ගෝපදේශය ප්‍රකාරව, පැහැදිලි කිරීම් ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. | නව දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහලේ උස එහි බිම් මට්ටමේ සිට අඩි 11ක උසකින් තබා ගොඩනැගිල්ල නිර්මාණය කරන ලෙස මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා ලබා දෙන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිලධාරින් වෙත උපදෙස්දී තිබුණු නමුත් අතපසු වීමකින් අඩි 9½ ක් වන ලෙස තබා අදාළ සැලසුම් සකස් කර ඇති බව, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඉංජිනේරුවරු වැඩ භූමිය පරීක්ෂා කර ගොඩනැගිල්ලේ පළමු මහලේ උස 450mm කින් වැඩි කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති අමතර ගාස්තුව වන රු.240,317 ක (Variation Cost) වටිනාකමට අදාළ අමතර වැඩ කොටස් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර ඇති බව, මෙම අමතර ගාස්තුව අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව හා ඉදිරියේදී ව්‍යාපෘතියේ වැඩ කටයුතු කර ගෙන යාමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.7** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 19 ක වැඩ බැලීමට එම තනතුරු සඳහා සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරීන් 19 දෙනෙකු 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් මුළු මුදල රු.මිලියන 2.12 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. | ආරක්ෂක නියාමක තනතුර අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති බව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි පෞද්ගලික සහ රාජ්‍ය ආයතන කිහිපයකින් ආරක්ෂක සේවය සඳහා මිල ගණන් කැඳවා ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු සඳහා නිසි අනුමැතියකින් තොරව සිදුකර ඇති බඳවාගැනීම් හා වැටුප් ගෙවීම් පිළිබඳව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, සංස්ථාව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට අදාළව ඉලක්ක සහ දර්ශක හඳුනා ගෙන ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර 2020 ජුනි 30 දිනට පෙර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් කොරෝනා වසංගත තත්වය හේතුවෙන් එම කටයුතුවල අපේක්ෂිත ප්‍රගතිය ලබාගැනීමට නොහැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |